# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 25/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 05/01/2024 පැය 1250

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බියගම පොලිස් ස්ථානය.**

2024.01.04 වන දින රාත්‍රී කාලයේ බියගම පොලිස් වසමේ සියබලාපේ හන්දිය ප්‍රදේශයේදී බියගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 30 මිලිග්‍රෑම් 550 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක්වූ මල්වාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදුකළ වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී මොහු විසින් මල්වාන දොම්පේ මාර්ගයේ කලුකොදයාව යකඩ පාලම යට සඟවා තිබියදී පිස්තෝල වර්ගයේ ගිනි අවියක භාවිතා කරන සජීව පතරොම් 08 ක්ද සොයා ගෙන ඇත.

බියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කුරුවිට පොලිස් ස්ථානය.**

2024.01.04 වන දින උදෑසන කාලයේ කුරුවිට පොලිස් වසමේ සිංහපුර කිතුල්පේ ප්‍රදේශයේදී කුරුවිට පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 68 ක් වන කිතුල්පේ, කුරුවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කුරුවිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මකුළුගස්වැව පොලිස් ස්ථානය.**

2024.01.04 වන දින සවස් කාලයේ මකුළුගස්වැව පොලිස් වසමේ පංගල ප්‍රදේශයේදී මකුළුගස්වැව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 58 හා 78 වයස් වල පසුවන දේවහුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මකුළුගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **මාරක රිය අනතුරක් - කොස්වත්ත පොලිස් වසම.**

2024.01.04 වන දින රාත්‍රී කාලයේ කොස්වත්ත පොලිස් වසමේ නාත්තණ්ඩිය දංකොටුව මාර්ගයේ හාල්දඩුවන ප්‍රදේශයේදී නාත්තණ්ඩිය දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට පාලනය කරගැනීමට නොහැකිව මාර්ගයේ දකුණුපසට ඇදී ගොස් ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි ජීප් රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාර් රථයේ රියදුරු දංකොටුව රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා මීගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වූ ඉරබඩගම, සඳලංකාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල ජීප් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කොස්වත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **මාරක රිය අනතුරක් - පුත්තලම පොලිස් වසම.**

2024.01.05 වන අද දින අළුයම් කාලයේ පුත්තලම පොලිස් වසමේ පාලවිය - කල්පිටිය ප්‍රධාන මාර්ගයේ මහපාලම අසලදි පාලවිය දෙස සිට කල්පිටිය දෙසට ධාවනය වූ ලොරි රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි යතුරු පැදියක මුහුණට මුහුණ ගැටි අනතුරක් සිදු වී ඇත.

අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදියේ පැදිකරු පුත්තලම රෝහලට ඇතුලත් කර කිරිමේදි මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ කරිකට්ටිය, මදුරංකුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - කුලියාපිටිය පොලිස් වසම.

2024.01.05 වන අද දින අළුයම් කාලයේ කුලියාපිටිය පොලිස් වසමේ පල්ලේවෙල ප්‍රදේශයේ පල්ලේවෙල දෙස සිට වීරඹුව දෙසට ධාවනය වූ ත්‍රිරෝධ රථය රියදුරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව තාප්පයක ගැටී විසිවී ගොස් විදුලි පහන් කණුවකද වැදී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රිරෝද රථයේ රියදුරු කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදි මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ වීරඹුව පාර, පල්ලේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කුලියාපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.